රුහුණ විශ්වවිද්‍යාලය
**2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 1000 ස්ථලය**
දෙවන සමාසික පරීක්ෂණය - **2017** මාර්තු

# FDN 1202 - සිංහල ලේඛන පරිචය

**ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

(නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

**කාලය : පැය 03 යි.**

---

01. (අ) වර්තමානයේ භාවිත වන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් නිවැරදි ව ලියා දක්වන්න.

(ආ) නූතන සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජනාක්ෂර, උත්පත්ති ස්ථාන අනුව වර්ග කරන්න.

(ඇ) සිංහල අක්ෂරවල ඝෝෂාඝෝෂ භේදය පැහැදිලි කොට අඝෝෂාක්ෂර ලියා දක්වන්න.

(ඈ) පහත සඳහන් ශබ්ද සංකේතවල ස්වර හා ව්‍යඤ්ජන වෙන් කොට ලියන්න.

වෛ, ව්‍ය, වෞ, ව්‍ර, වී

02. (අ) ඔබ විසින් රචිත ග්‍රන්ථයක් විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී දොරට වඩින්නේ යැයි සලකා ඒ සඳහා ආචාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ආ) තම ගමෙහි පුස්තකාලය සඳහා පොත්පත් අවශ්‍ය බව පවසමින් අභිමත ස්වේච්ඡා සංවිධානයක් වෙත යොමු කෙරෙන ලිපියක් සම්පාදනය කරන්න.

(ඇ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය විෂය පළමුවර අසමත් සිසුන් සඳහා පැවැත්වෙන පුනරීක්ෂණ පාඨමාලාවකට අදාළ ව පුවත්පත් දැන්වීමක් නිර්මාණය කරන්න.

03. (අ) පහත දැක්වෙන වචන නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව නැවත ලියන්න.

| | |
|---|---|
| අදර්මිෂ්ට | ක්ෂීරඵතය |
| අනුඵස්තිථිය | ලේකණය |
| උල්ලංගණය | චූළ වංශය |
| අෂ්යපරිෂ්බාර | ජේෂ්ට |
| උපාදිධාරිණිය | ඥානවන්ත |
| අභිගුණ්ටික | පාපිෂ්ට |
| ආබාෂය | පිලිවෙල |
| ඍජුකෝනාශ්‍රය | ප්‍රභාසංශ්ලේශනය |
| කඩපොල | වෙලදපොල |

| | |
|---|---|
| කණ්නාඩිය | සමාර්ත්‍යය |
| කාර්‍යාලය | සුභාසිංශනය |
| කුෂලතා | ගාලගෝට්ඨීය |

(ආ) පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට සකස් කොට නැවත ලියන්න.

| | |
|---|---|
| හෝදාපාළුව | වෛදික |
| ළමයා | ලාඤ්ජනය |
| හොඬවැල | රක්ෂණ |
| ස්වභාෂාව | මෘදුච්චාරණය |
| සෙංකෝලය | බෞද්ධ |
| ශ්‍රී විභූතිය | අත්‍යාලංකාර |
| නඳුනුයන | නැණසල |
| දර්පණය | දර්ශනය |
| තොරණ | ත්‍යාගශීලී |
| ප්‍රත්‍යුපකාර | ප්‍රථමාධාර |
| බොළඳ | භීෂණය |
| මහභිනික්මන | මූලෝත්පාටනය |

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. මම පන්තියට සහභාගි නො වී යහළුවෝ සමඟ විනෝද වෙති'යි අම්මා සැක කරයි.
ii. ඔබලා සියල්ලෝ ම නියමිත වේලාවට පැමිණිය යුතු ය.
iii. මම ද යහළුවෝ ද නුඹලා ද විභාගයට සාර්ථක ව මුහුණු දෙන්නෙමු.
iv. ක්‍රීඩකයෝ ජයග්‍රහණය ලබනවා දැක නරඹන්නන් අත්පොළසන් දුන් හ.

(ආ) වරහන් තුළ ඇති වචන අතුරෙන් නිවැරදි වචනය තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කර නැවත ලියන්න.

i. දක්ෂ (ගුරුවරයෙක්/ගුරුවරයකු) වූ ඔහු අදක්‍ෂයන් දක්‍ෂයන් බවට පත් කළේ ය.
ii. ලොව සුපතළ (ලේඛිකාවක/ලේඛිකාවක්) විසින් එම ග්‍රන්ථ කිහිපය රචනා කරන ලදී.
iii. සිංහලයෝ (සියල්ලන් ම/සියල්ලෝ ම) බෞද්ධයෝ නො වෙති.
iv. මහ රජාණෝ ඇමතිවරුන් සමඟ සභාගර්භයට (පිවිසියේ ය./පිවිසියෝ ය.)

(ඇ) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. සංවිධායකයෝ උත්කර්ෂවත් ආකාරයෙන් තරගය පැවැත්වූ හ.
ii. ශිෂ්‍යයෝ කිහිපදෙනෙක් උත්සවයේ දී සම්මාන දිනා ගත් හ.
iii. මම දිනපතා පැය කිහිපයක් ව්‍යායාම කරමි.
iv. නරඹන්නෝ ජයග්‍රාහකයන් හරසරින් පිළිගත් හ.

05. (අ) සම්මත සිංහල කමිටු වාර්තාවට (1968) අනුව පහත ඡේදයෙහි පද බෙදා නැවත ලියන්න.

"ඒඅනුව පාලි බෝධිවංශයයෙහි පැනෙන දුරවබෝධ පද 205 කට පරිකථා සැපයීම ධර්මප්‍රදීපිකාවෙහි ආරම්මණයවේ. එමෙන් ම කෘතියෙහි අවසානයෙහි සඳහන් "ගුරුළුගෝමීන් විසින් කරනලද ධර්මප්‍රදීපිකා නම් මහාබෝධිවංශ පරිකථා නිමි" යන ගද්‍ය කාණ්ඩයෙන්ද කෘතියෙහි කර්තෘ ගුරුළුගෝමී නැමැත්තකු බව අනාවරණය වේ. කෘතියෙහි ආකෘතිය පරිකථාවක් වුවද එය ව්‍යාඛ්‍යානයක් වශයෙන්ද කියවිය හැකිබව ආනන්ද කුලසූරිය මහතාගේ මතයයි. මේඅනුව මෙම කෘතිය පරිකථාවක් සේම ව්‍යාඛ්‍යානයක් ඇසුරෙන් ද ග්‍රාහකයා ට රසවිඳිය හැකිය. තත්කාලීන සමාජ වපසරියට අනුකූලව ගුරුළුගෝමීන්ගේ මුඛ්‍ය ග්‍රාහකයා කවරෙක් වූයේද යන්න කෘතියෙහි සමාරම්භයෙහිම දක්නට ලැබෙන ගද්‍ය කාණ්ඩයකින් ප්‍රකටීභූත වේ. කතුවරයා කෘතියෙහි යම් යම්තැන්හි මිශ්‍ර සිංහල භාෂාවක් අනුගමනය කළද නො වියත් ජනයා සඳහා කෘතියෙහි සමස්ත ඉඩ කඩ වෙන් කිරීමට අමතක කර නැත."

(ආ) සිංහල ලේඛන රීතියට (1989) අනුව පහත වාක්‍යයන්හි පද බෙදා නැවත ලියන්න.

i. දෙ ලක්ෂ හත් දහසක් පමණ උද්ඝෝෂකයෝ ඇමරිකානු ජනාධිපති දිවුරුම් දීමට එරෙහි ව තැන තැන කලහ කළහ.

ii. එරබදු මල් වලට බඹරුන් නො පැමිණෙන බව ජන කවියක සඳහන්වේ.

iii. මම රූපවාහිනිය දෙස බල බලා කෑම කෑවෙමි.

iv. අම්මා ත් තාත්තා ත් නො දැකීම ඇයගේ වේදනාව වැඩිවීමට ප්‍රධාන හේතුවක් විය.

v. කිසිකෙනෙක් දේශනයට නොපැමිණියහ.

vi. ඇය උණු උණුවේ ගෙනා තේ කෝප්පය කටින් පිඹ පසෙකින් තැබුවා ය.

vii. මිනිසුන්ගේ හිත් වල කළ හොඳට වඩා නො හොඳ ඉතිරි වේ.

viii. මල්ලි යි මම යි වැස්සේ තෙමෙමින් නැටුවෙමු.

06. ජීව දත්ත පත්‍රිකාවක් සැකසීමේ දී තොරතුරු සංවිධානය කළ යුතු ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

07. "සිංහල භාෂාවෙහි උක්ත - අනුක්ත භේදය පැහැදිලි ව හඳුනා ගත හැක්කේ ඇතැම් පද වර්ග කෙරෙන් පමණි." මේ ප්‍රකාශයට පක්ෂ ව හෝ විපක්ෂ ව හෝ ඔබේ අදහස් දක්වන්න.

08. ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්වීමේ ක්‍රමවේද පිළිබඳ හාර්වඩ් ශෛලිය (Harved style) නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.)

@@@@@@@@@